

# අඳුන් සිහින 12

හේමමාලා හේරත් ලියන නවකතාව

***මෙතක් කතාව:***

*රිදීමා, මහීකා, රුචිරා සහ අමා ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි, විශ්ව විද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා තමා දක පුරුදු තරුණයෙකු නිතර දකී. එහෙත් ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත. මහීකාගේ පෙම්වතා වන අජයගේ ළඟම මිතුරා දිනූෂද රිදීමාට ආදරය කරයි. එහෙත් නිශ්ක නැමැති තරුණයා පිළිබඳව රිදීමාගේ සිතෙහි ඇත්තේ කුමන හැඟීමක්දැයි යහළුවන් සියල්ලටම ගැටළුවක් වේ. මින් රිදීමා පීඩා විඳී. අවසන මෙම රහස විසඳාගැනීම සඳහා සියල්ලෝම ශ්‍රී ලංකාව බලා පිටත් වෙති. අජය ගම්වැසියන්ගෙන් මෙහි තොරතුරු අනාවරණය කර ගැනීමට වෙහෙසන අතර, රිදීමා තම යෙහෙළියන් හා පිංචි කෙල්ලද සමඟ වැඩිදුරටත් තොරතුරු සොයයි.*

***අද එතැන් සිට:***

රිදීමා රන් වළලු පැළඳ ගන්නවා අමාද, මහීකාද බලා උන්නෝය. රිදීමාගේ දෙනෙත කාන්තිමත් වූ අතර දෙතොලෙහි වූයේ මද සිනහවකි.

"මට බඩුවක් මතක් උණා....."

ඈ කුඩා දැරියක් මෙන්, අමා අසලින් ඇඳෙහි හිඳගත්තාය.

"මොකක්ද ඔය බඩුව ?" ඇසුවේ මහීකාය.
"ඒක තියෙන්නේ සොල්දරේ......" රිදීමාගේ දෑස තවත් දීප්තිමත් වෙනු අමා දුටුවාය.

"කියන්න බැරි බඩුවක්ද ?" මහීකා යළිත් ඇසුවාය.
"පෙන්නන්න පුළුවන් බඩුවක්. එන්න යමු..."

රිදීමා, අමාගේ අතින් අදිමින් පැවසුවේ දඟකාරවය. ඔවුන්ගේ විමතියට පත්වූ මුහුණු දුටු ඈ හඬ නගා සිනාසුනාය.

"එයා හැමතිස්සෙම හරිම දඟයි...."

යෙහෙළියෝ එකිනෙකා දෙස බලාගත්තෝය. රිදීමා දබරැඟිල්ල තම දෙතොල මත තැබුවාය.

"ෂ්: සද්ද කරන්න එපා. අම්මට ඇහුණොත් කරදරයි......"

රිදීමා හෙමිහිට කාමරයේ දොර රෙද්ද මෑත් කළාය. ලොකු මැණිකේ හෝ පළිඟු මැද සාලයෙහි දක්නට නොවූහ. කෙටි බිත්තියකින් වටවුණු ආලින්දයේ සිටි යහළුවන්ගේ කතාබහ ඇයට නොපැහැදිලි ලෙසින් ඇසුණෝය.

"එන්න......." රිදීමා හැරී අමාට හා මහීකාට හිසින් සංඥා කළාය.

"මේ පෙට්ටිය ?" ඇසුවේ අමාය.
"ඕක වහලා ඇඳ යටට තල්ලු කරන්න......."

මහීකා වහා නැවී, පෙට්ටියෙහි පියන වසා, එය ඇඳ යටට තල්ලු කළාය. යෙහෙළියෝ සෙමින් රිදීමා පිටුපස වැටුණාහ.

ඔවුන්ගේ 'කිචි, බිචිය' ඇසුණු අජය, ගෙතුලට කරපොවා බැලුවේය.

"ගෑනු ලමයි ටික හොර ගමනක් යනවා වගේ....."
රිදීමා පස්ස නොබැලුවාය. මහීකා පසුබසිනු දුටු අමා, අගේ සුරතින් ඇද්දාය.

"ඉක්මණින් යමු. නැත්නම් අපට අර කෙල්ල මග ඇරෙයි...."
"මොකක්ද ප්‍රශ්නේ ?"

තාමත් ගෙතුල දෙසට කර පොවා සිටි අජයගෙන් දිනූෂ විමසීය.

"ගෑනු ළමයින්ගේ මොකක් හරි හොරයක්...... අපට නොකියම සද්ද නැතිව දුවලා ගියේ !"

නදින් අය්යාගේ මුහුණ සුදුමැලිව යනු, අජය දුටුවේය.

"ඇයි නදින් අය්යා ?"
"මුකුත් නැහැ අජය. අපේ නංගිට නිකන් ඉන්නම බැහැනේ. ඒ පාර මොන ලෙඩක් දාගන්න හදනවද දන්නෑ අප්පච්චිත් ගෙදර නැති වෙලේ......."

★ ★ ★ ★ ★ ★ ★ ★

සිය කාමරයේ, උඩවියන් සහිත අඳෙහි හාන්සිව සිටි ලොකු මැණිකේට, රිදීමා සාලය හරහා නිවසෙහි වම්පසින්වූ තරප්පිය වෙත දිවයනවා ඇසුණෝය. තීව්‍ර වූ හිසරදය දරාගත නොහැකිවූයෙන්, ඈ හිස දෑතින්ම බදා ගත්තාය.

"පළිඟු......... පළිඟු..." ඈ කෙඳිරි ගෑවාය.
"අපෙ මැණිකේ ?"

පළිඟු කාමරයට පැමිණියේ තවත් විනාඩි ගණනක් ප්‍රමාදවෙලාය.

"ඇයි මැණිකේ ? ඉසේරදේ වැඩිවත්ද ?"
ඈ ලොකු මැණිකේගේ නළල මත තම පිටි අත්ල තබා බැලුවාය.

"සී වරන් දෙය්යනේ ! තදින්ම රස්නෙයි නොවැ..... ! දොස්තර හාමුට එන්න කියන්නද ?"
"එපා...." ලොකු මැණිකේ කෙඳිරි ගෑවාය.

"මට ඔය බේත්පෙති බෝතලේ දීපන් වතුර වීදුරුවක් එක්ක....."

පළිඟු, ලොකු මැණිකේගේ කොට්ටා හරිබරි ගස්වා, ඇයව ඇඳ විට්ටමට හේත්තු කළාය. ඊළඟට බෙහෙත්පෙති හා වතුර වීදුරුවද දුන්නාය.

"අපේ මැණිකෙගෙ ප්‍රෙසර් නැගලා වගේ....."
"උඹ කටවහගෙන ඉඳින් තව ටිකකින් මේ ඉසේ ඇම්ම බැහැලා යයි...." ලොකු මැණිකේ දෑස් විවර කළාය.

"බලපන් සුදු බේබි මොකාටද එන්න හදන්නේ කියලා. බලාගෙන යනකොට මේ දැරිවිත් අරවගේම නොවැ. කියන දේ නාහන ගුරු ගැන ඔය කතාවකුත් තියෙන්නේ..."

පළිඟු සිය අත්ල, නිකට මත තබා ගත්තාය.

"මේ නෝන, මහත්තැන් ටික මෙතැන නොපිරුණා නම් සුදු බේබි මේ විදියට වෙනස්වෙන්නේ නෑ...."

"කමක් නෑ...... වෙන දෙයක් වෙද්දාවේ. එයාට තේරෙන්නෙ නෑ අපි හැමදේම කරන්නේ එයාගේ හොඳට බව. කවදාහරි තේරුම්ගන්නේ නැතෑ..... උඹ ගිහින් කෑම ටික හදහන්. සිරියාවතී ආවද උදව්වට ?"
"ඔව් මැණිකේ. ඔය ඇවිත් ඉන්නේ...."

"හොඳට කෑම ටිකක් හදලා ගනින්. අර පිට ළමයිනුත් ඉන්නවනේ...."

"පුහ්...." පළිඟු පැවසුවේ හොඳ හිතකින් නොවේ. වැඩපොළ වැඩිවූවාට, ඇගේ හිතේ අමනාපයක් නැත. අමනාපයක් ඇත්තේ, ඔවුන් සුදු බේබිට පාඩුවේ ඉන්න නොදෙනා එකය.

"පලයන් කීවමම අහලා......" ඇය පැකිලෙනු දුටු ලොකු මැණිකේ පැවුසුවාය.
"හවස් වෙන්නට කලින් බණ්ඩාර අප්පොත් එයි."

බණ්ඩාර අප්පොගේ නම ඇසෙත්ම, පළිඟු වහා කාමරයෙන් පිටවූවාය. ඔහුගේ කටට, අනෙක් අය මෙන් ඈද බියවූ නිසාය.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★

රිදීමා නැග්ගේ, උස්, හීනී තරප්පු පේළියකි.

"මේ කොහෙද මෙයා අපිව ගෙනියන්නේ ?" සිතට නැගුණද, අමා එම ප්‍රශ්ණය නෑසුවාය. "කකුලක් වැරදිලා හරි ලෙස්සුවොත් ඔක්කොම ඉවරයි......." මහීකා කෙඳිරි ගෑවාය.

"උඹ අපිව මේ ගෙනියන්නේ එක්ටැම් ගේකටද ? ඈ විමසුවාය. රිදීමා පසුපස බලා සිනාවක් පෑවාය. ඇය සම්පූර්ණයෙන් වෙනස් වූ ලෙසකින්, අමාට පෙනීගියේ.

"අපට තිබුණේ අජයයි, දිනූෂයි අඬගහගන එන්න..."
ඈ රහසින් පැවසුවාය.

"මට රිදීමාගේ හැසිරීම අල්ලන්නේ නෑ....."
"එයාලට අපි කෑගැහැව්වොත් ඇහෙයිද ?" මහීකා පහත් හඬින් ඇසුවාය.

"මම දන්නේ නෑ..."

"ඔය දෙන්නා බොරුවට බයවෙලා රහස් කතා කරන්න එපා. මට මුකුත් වෙලා නෑ...." ඉදිරියෙන් යන රිදීමා පැවසුවාය.

"මට මතක් උණා මගේ මැරුණු අතීතයේ කොටසක් ! මට හරි සතුටුයි. ඒ ඇත්තද බලන්නයි මම මේ යන්නේ."

"ඒ ටික අපට කීවා නම් බලන්න." මහීකා කීවාය.
"ඒක ඇස්දෙකෙන්ම දකින එක තමා වැඩියෙන් හොඳ." රිදීමා පැවසුවාය.

"මටත් හිතාගන්න බෑ ඒ ටික ආයම මගේ ඇස් දෙකෙන් දකිනකල්. ඒ හන්දයි ඉක්මනට දුවන්නේ...."

"මේ පඩි පෙලේ නම් ඉක්මනට නොදිවට කාරි නෑ..." අමා පැවසුවාය.
"කකුල් කඩා බිඳගන්නේ නැතිව පරිස්සමින් යමු......."

තරප්පිය අවසාන වන තැන වූයේ පියන් දෙකේ මහදොරකි. එයට ඉබ්බෙක් දමා උන්නේය.

"ඔන්න මහීකාට තවත් වැඩ...." අමා සිනාවක් පෑවාය.
"සිම්පල්" මෙවර මහීකා අතට ගත්තේ කොන්ඩා කූරකි.
"ඔන්න බලාගන්න මගේ වැඩ...."

ඇය ඉසබා විවර කරනු දුටු රිදීමාට මෙන්ම අමාටද සිනහ පහළවිණි. මහීකා වැඩය අහවර කොට දෑත් පිසදා ගත්තාය.

"දැන් මම දන්නවා මාව ගෙන්න ගත්තේ ඇයි කියලා."

රිදීමා ඉසබා ගලවා දොර විවර කිරීමට තැත් කළාය. කාලයක් වසා තිබූ බැවින් දෝ එය විවර

